# සුවනී- සුරංගනාවී

සුවනී- සුරංගනාවී,

කම්මුල් දිගේ කඳුළු මිදිලා මිදිලා පුංචි වේලිච්ච දිය සීරාවන් හැදිලා - මට පේනවා.

කම්මුල්වල රතු පාට කළු පාට ලප - මට පේනවා.

මූණ පුරා හීරිලා. ලේ පුරනවා. මට පේනවා.

තොල් මැරෙනවා - මට පේනවා.

මම දන්නෙ නැහැ. නාට්‍යයක් ඇතුළෙ ඔයාව හිර කරන්න මට බැරි වෙයි. ඒ ඔයා විශ්වය තරම් විශාල නිසා. අහස තරම් ලස්සන නිසා.

2007 දෙසැ. 7

වොල්ගාව

"ඇයි ඔහොම බලන්නේ."

"ගිලින්ඩ."

සුවනී හිනා වුනා. ඇගේ හිනාව දිගේ ටුට්ටි හුඟාක් දුර ගියා. සුවනීගේ සුරංගනා ඇස් දෙකේ නිල් පාට පසාරු කරගෙන හුඟාක් දුර ගියා.

පැපරාසීන්ට එන්න බැරි තැනක - කළු පාටින් ටින්ට් කරපු ලොකු වීදුරු ගෝලයක් ඇතුළේ- ඒ වීදුරු ගෝලය වොල්ගා ගඟ පතුලේ පාවෙමින් තිබුණෙ. හුළඟට ගැලවිලා විසි වෙන්න ඔන්න මෙන්න තියන කපු පුළුන් රොදක් වගෙයි ටුට්ටිගෙ හිත.

"ඔයා කැමති මොනවටද සුවනී?"

"ම්... සිංදු කියන්නනේ."

"නැහැ මං ඇහුවේ. ඊගාවට?"

"ම්.. බෝනික්කන්ට."

"අපෝ පොඩි බබා."

සුවනී ටුට්ටිගෙ අත කෙනිත්තුවා.

වීදුරු ගෝලය ඇතුළෙත් හෙමින් හිම වැටුනා.

"මං ලොකු බෝනික්කෙක් ගෙනත් දෙන්නම්."

"හා."

"ඔයා මට ආදරේද?" ටුට්ටි මාළුන්ට ඇහෙයි කියලා බයේ හෙමින් ඇහුවෙ.

සුවනි නිල් පාට ඇස් ලොකු කරලා ඒවා ඇතුළෙ උන්නු ටුට්ටිව එළියට දැම්මා.

"ම්.. බරපතල ප්‍රශ්නයක්."

"කියන්න සුවනි."

"දැන්ම බෑ."
"ඇයි?"
"පස්සෙ."
ඊගාවට සුවනි ඒ දෙන්නා කියන ජනප්‍රිය සිංදුවක් කියන්න ගත්තා. මාළු පීනගෙන ඇවිත් වීදුරුව වටේ ඉඳන් අහං උන්නා. ටුට්ටිත් සිංදුවට එකතු වුනා.

වොල්ගා ගඟට නින්ද ගියා හොඳටෝම. මාළුත් නිදි අන්තිමේදි. සිංදුව ඉවර වෙද්දි සුවනි ටුට්ටිගෙ උරහිසට තුරුළු වෙලා උන්නා. ටුට්ටිගෙ ඇඟිලිතුඩු සුවනිගෙ කෙහෙරැල් අතරේ එහා මෙහා දුව දුව මොනවදෝ හෙවුවා.

2007 දෙසැ. 9
**මෝනිං ප්ලැනට් පුවත්පතේ මුල් පුවත**
# සුවනී- සුරංගනාවී අප හැර යයි.

ටිබුල් මීඩියා සුපිරි තාරකාවී- **සුවනී යෙව්තුෂෙන්කෝ** (19) ඝාතනය කර ඇති අතර පිහි ඇනුම් දහ හතක් සහිත ඇගේ සිරුර අද අළුයම 5.35ට පමණ වොල්ගා ගං ඉවුරේ පැරණි ලෙනින් ප්‍රතිමාවේ පාදම අසල තිබී හමු වී ඇත. නිල නොලත් ආරංචි මාර්ග අනුව මෙම ඝාතනය ඇගේ උමතු රසිකයෙකු විසින් සිදු කරනු ලැබ ඇති අතර ඝාතනයට පෙර ඈ දූෂණයට ලක්ව ඇතැයි ද සැලකේ. සුවනීගේ අවසන් කටයුතු පිළිබඳ තවම තීරණය කොට නැති බැව් වාර්තා වෙයි.

සුවනී, ටිබුල් රූපවාහිනී සුපිරි තරු ගී ගායනා තරඟයෙන් **ටුට්ටි වැග්නොව් (23)** සමග සම කිරුළ ලබා ගායන ක්ෂේත්‍රයේ දිගු ගමනකට එළඹ සිටි අතර, සොවින් වියරු වූ තරුණ රසික රසිකාවියෝ ඇගේ සිරුර සොයා ගත් ගං ඉවුර ප්‍රදේශයේ රැස් වී සිටිති. දැනටමත් මුළු ප්‍රදේශයම ශෝක වෙන්නන්ගේ මල් පොකුරුවලින් වැසී යන්නට පටන් ගෙන තිබේ.

සුවනීගේ මරණය පිළිබඳ තම බලවත් ශෝකය පල කරන ජනාධිපතිතුමා....
**දහ වෙනි පිටුවට.**

2007 දෙසැ. 9
**ප.ව. 10.30**
**ටිබුල් මීඩියා ඇතුළු කාමරය.**

රවුම් මේසයේ ටුට්ටි ප්‍රේක්ෂකයාට පිටුපා හිඳගෙන හිඳී. ඔහුට ඉදිරියෙන් ප්‍රේක්ෂකයාට මුහුණ ලා පිළිවලින් ටිබුල් මීඩියා වැඩසටහන්

අධ්‍යක්ෂකවරයා, කළමනාකාර අධ්‍යක්ෂකවරයා සහ වෙළඳ ප්‍රවර්ධන අධ්‍යක්ෂිකාව හිඳගෙන හිඳිති.

මේසය මත ටුට්ටි ඊයේ හවස සුවනීට දෙන්නට ගත් ලොකු බෝනික්කා මුනින් තලා කොට වත්තම් කොට තිබේ. සයික්ලොරාමාව මත කළමනාකාර අධ්‍යක්ෂකවරයාගේ විශාලිත සෙවණැල්ල ප්‍රක්ෂේපණය වී තිබේ. පසුබිමින් කුඩා දැරියකගේ සියුම් ඉකියක් ඇසේ.

ක.අ. - ටුට්ටි නිකං මෝඩයෙක් වගේ හැසිරෙන්න එපා දරුවෝ.

වෙ.ප්‍ර.අ. - අපිත් ඉන්නෙ දුකෙන්. ඒක ඔයා දන්නවා. ඒක තමයි හරියට නිකං රැජිණක් මැරිලා වගේ ග්‍රෑන්ඩ් ෆියුනරල් එකක් ඕගනයිස් කරන්නෙ. මේකට හෙවි කොස්ට් එකක් යනවා. ඔයා දන්නවනෙ අපේ බජට් එක අපි කවර් කර ගන්න ඕනෙ.

ක.අ. - ඇත්තටම දරුවො මේක අහපු වෙලාවෙ මාව ෂොක් වුනා- ඔයා වගේ තමයි අපිත් සුවනිට ආදරෙයි.

වැ.අ.- ජීවත් වෙන සුවනිට වඩා මැරිච්ච සුවනිට මිනිස්සු ආදරෙයි. ඔයා දන්නවද මේ සීන් එක අහලා කී දෙනෙක් ෂොක් වෙලා හොස්පිටල් ඇඩ්මිට් කලාද කියලා.

වෙ.ප්‍ර.අ. - ඔයාට මේ මියුසික් වීඩියෝ එක කරන්නම වෙනවා. ලිරික්ස් ලියලා ඉවරයි. මියුසික් ට්‍රැක්ස් ගහලා ඉවරයි. ස්ටෝරි බෝඩ් එක හදලා ඉවරයි. කොස්ටියුම්ස් ඉවරයි. බලන්ඩ පැය කීයද ගියේ සුවනිගෙ බොඩි එක හොයා ගෙන. මුළු ටිබුල් ටීම් එකම මේ වැඩේ කොන්සන්ට්‍රේට් කරගෙන ඉන්නෙ. ඔයා පොඩි ළමයෙක් වගේ හැසිරෙන්න එපා.

ක.අ.- දරුවෝ- දරුවෝ ඔයා දන්නවා ඔයා අපිත් එක්ක ඉන්නෙ කන්ට්‍රැක්ට් එහෙක.

වැ.අ.- යා. යූ කාන්ට් එස්කේප් ෆ්‍රොම් දිස්.

ටුට්ටි ඔළුව මේසය මත තබා ගනියි. දැරියගේ ඉකිය හැඬුමක්ව ඇසෙන්නට ගනියි.

වැ.අ. - ෆියුනරල් එක දවසේ එදාම රෑ මියුසික් වීඩියෝ එක රිලීස් කරන්නෙ. හැමෝම සැක කරනවා ඔයාගෙයි සුවනිගෙයි එෆෙයාර් එකක් තියනවා කියලා. අපිට එහෙම එකක් තිබ්බත් එකයි- නැතත් එකයි. හැබැයි ෆෑන්ස්ල බලං ඉන්නවා ඔයා මේක කරයි කියල. ඔයා දන්නවා සුවනිගෙ ලොස් එකෙන් අපේ මුළු ප්‍රොජෙක්ට් එකම කඩං වැටුනා. අපි ඒ ඩැමේජ් එක රිකවර් කරන්ඩ ඕනෙ.

ක.අ.- ඔයා දන්නවද මේක කොච්චර ලොකු ඔපචුනිටි එකක්ද කියලා. සුවනිගෙ බොඩි එකේ එක තුවාලෙකට එක ස්පොන්සර් කෙනෙක් ගානෙ ස්පොන්සර්ස්ලා දාහතක්. (බෝනික්කාව අතට ගෙන එහි තැන් තැන් වලට ඇඟිල්ල තබා පෙන්වයි.) ෆියුනරල් එකේ හැම ඉවෙන්ට් එකක්ම ස්පොන්සර් කරනවා. කොටින්ම මිනියට අන්දන යට ඇඳුමේ ඉඳං පෙට්ටිය දක්වා හැම දෙයක්ම.

වැ.අ. - ඔයා එදාට සෙමෙට්‍රි එකට ගිහිං කා එකෙං බහින තැන ඉඳං බොඩි එක ළඟට ගිහින් බොඩි එකේ අත් අල්ලලා ගුඩ් බායිකරන තැනට එනකං ටේක් එක අපි මියුසික් වීඩියෝ එකට දානවා. (නැගිට එම සිදුවීම අනුකරණය කරයි.) ඔයා ගිහිං බහින කා එක අර අළුත් කා කොම්පැනියෙන් දෙන්නේ. එයාල ඒ කා එක ඔයාට යූස් කරන්න දෙනවා දිගටම. ඇන්ඩ් ඔයාගෙ ඩ්‍රෙස් එක- ෂූස් - හෙයා ජෙල් එක- අන්ඩ වෙයා එක- වොච් එක ඔක්කොටම දැනටමත් ඇග්‍රීමන්ට් සයින් කරලා ඉවරයි.

ටුට්ටි නැගිට ප්‍රෙක්ෂකයාට මුහුණ ලා ඇවිද එයි. ඔහු දෙබස් කියනු පෙනෙන අතර හඬ නොඇසෙයි. දැරියගේ හැඬුම උස් වැලපිල්ලක් බවට පෙරලෙයි.

වෙ.ප්‍ර.අ. - මියුසික් වීඩියෝ එකත් එක්ක ඔයාගෙයි සුවනිගෙයි අනික් සිංදුත් දාල පහුවදාම සී.ඩී. එක රිලීස් වෙනවා. ඒක මිලියන්ස් වලිං සෙල් වෙයි. නිකං තොත්ත බබෙක් වෙන්න එපා ටුට්ටි.

වැ.අ. - ඔයා හෙට පාන්දරම සෝන්ග් එක රිහර්ස් කරන්න පටං ගන්න ඕනෙ. මෙහෙ එනවා මේ ඇග්‍රීමන්ට් එක සයින් කරනවා.

ටුට්ටි වේදිකාවේ ඉදිරි පඩි පෙලෙන් ප්‍රේක්ෂකාගාරය දෙසට බසියි.

වෙ.ප්‍ර.අ. - ඉඩියට්.

ක.අ.- හරි අපි ඔයාට සික්ස් අවර්ස් දෙනවා. ඔය දරුවා රිලැක්ස් එකේ ඩිසිෂන් එක ගන්ඩ.

වැ.අ.- ටුට්ටි.

ටුට්ටි වේදිකාවෙන් බිම සිටියි. සෙමෙන් පිටු පා පියවර මනියි. පසුබිමින් එන දැරියගේ හැඬුම මහා විලාපයක් වෙයි.

වෙ.ප්‍ර.අ. -  මෙන්න මේකත් අරං යනවා.

මේසය මත වූ බෝනික්කා ගෙන ටුට්ටි දෙසට විසි කරයි. ටුට්ටි බෝනික්කාවත් අහුලා ගෙන ප්‍රේක්ෂකාගාරය දිගේ රංග ශාලාවේ ප්‍රධාන දොරටුවෙන් එළියට යයි. වාහනය පණ ගන්වනු ඇසේ.

2007 දෙසැ. 10
අළුයම 03.30
ටුට්ටිගේ කාමරය.

ටුට්ටි බෝනික්කා එක්ක කතා කරනවා.

මං හුඟක් ආදරෙයි ඔයාට. ඒත් මම කියන්නෙ කවුද? මම කියලා කෙනෙක් ඉන්නවද? මගෙ සිංදු. මගෙ සී.ඩී. එක. මගෙ මියුසික් වීඩියෝ. මගෙ ෆැන්ස්ලා. මගෙ කොණ්ඩෙ. මගෙ ඇඳුම්. මගෙ දත් බුරුසුව. මගෙ ඔරලෝසුව. මගෙ මොබයිල් එක. මගෙ කාර් එක. මගෙ එපාට්මන්ට් එක. මේ ඔක්කොම එකතු වෙලා නේද මම හැදුනෙ. ඒව අත ඇරපුවහම සුවනිට ආදරේ කරන්න්න මම කියලා කෙනෙක් ඉන්නවද? ඔයා මැරිලා. මමත් මැරිලා. බෝනික්කෝ, අපි නිදියමු. අපි නිදියමු.

ටුට්ටිටයි බෝනික්කටයි මහන්සියි. ගොඩක්. එයාල තුරුල් වුනා. නින්ද ගියා.

හීනෙන් බෝනික්කා ඇහැරුනා. ඈ දෙව්දුවක් වගෙයි. ලස්සන හිම පාට සුරංගනා මිනී ඇඳුමේ ලේ පාට මල් දා දාහතක් තිබුණා. ඊට පහළින් තිරයේ ස්ක්‍රොලිං බාර් එකක් ප්‍රින්ට් වුනා අකුරෙන් අකුර රිදමයකට.

"සුවනීගේ ඇඳුම් සඳහා අනුග්‍රහය - පවුලූෂා මෙගා ටෙක්ස්"

ඒ ගොල්ලො හිටියේ වොල්ගාව පතුලේ කළු පාට වීදුරු ගෝලයේ. බොනික්කා ඇස් පිල්ලම් ගහුවා එක දිගට. ටුට්ටි ඇගේ කම්මුලක් ඉම්බා.

"ටුට්ටි. බඩ්ඩක් කියන්නම්."

"මං දන්නවා අර පස්සෙ කියනවා කිවුවෙ."

"මොකද්ද?"

"සුවනී ඔයා මට.."

"හ්ම්"

"ආදරෙයි?"

"හ්ම්. මං ඔයාට ආදරෙයි."

"ඒත් ඇයි මේ කඳුළු ඇස් වල?"

හිම බිඳිත්තක් වගේ පුංචි කඳුලක් බෝනික්කාගෙ ඇහි පිහාටුවක් දිගේ මෝදු වුනා. බෝනික්කා ඉකි හැඟුවා. මාළු ඇඬුවා. වොල්ගාව වැලපුනා. තරු කඩන් වැටුනා.

හීනය කෙටි විරාමයකට නතර කළා අනුග්‍රාහක භවතුන්ගේ ශුභාරංචි කීපයක් සඳහා.

"ටුට්ටිගේ නිල මෙට්‍රස් සැපයුම්කරු - අක්ෂානා ඩ්‍රීම්ස් - සුව නින්දක් හීන ගොඩක්"

"සුවනීගේ නිල එම්බාම්කරු - වයිල්ඩ් රෝස් එම්බාමිං"

"ටිබුල් ටී.වී. - පීපල්ස් සේවියර්"

දැන්වීම් යන අතරේ ටුට්ටි ඇහැරුනා. වෙලාව පාන්දර 4.55යි.

"01 මැසේජ් රිසීව්ඩ්"

ටුට්ටි මැසේජ් එක කියෙව්වා.

**"ඉක්මනින් තීරණය දෙනුම් දෙන්න. පෙ.ව. 5.00 ට පෙර. නැත්නම් අපි මෙද්වෙදෙන්කෝ එක්ක ඇග්‍රිමන්ට් සයින් කරනවා. - ටුබුල් මීඩියා"**

බෝනික්කා හිටියා මැරිලා.

ටුට්ටි රිප්ලයි කෙරුවා. අකුරෙන් අකුර ටයිප් කෙරුවා. බර - ලොකු අකුරු.

**"මම කැමතියි."**

ටුට්ටි ඇඳුම් සේරම ගලවලා කාමරේ කණ්නාඩිය ඉස්සරහට ගියා. හෙළුවෙන්. අමු හෙළුවෙන්.

ටුට්ටිගේ රුවට යටින් කණ්නාඩියේ පහළ දාරය දිගේ ස්ක්‍රොලිං ඇඩ් එකක් හෙමින් ප්‍රින්ට් වුනා රිද්මයකට. බෝනික්කා හිටියා මැරිලා.

"ටුට්ටිගේ ඇඳුම් සඳහා අනුග්‍රහය - පවුලූෂා මෙගා ටෙක්ස්"

**නිෂ්පාදක සටහන.**

අපි **සුවනී- සුරංගනාවී** නාට්‍යය මුලින්ම රංග ගත කළ දිනයේ අහඹු සිදුවීමක් වුනා. වේදිකා ආලෝකකරණය කළ ලයිට් බෝඩයට සම්බන්ධ කුඩා ෆියුසයක් නාට්‍යයේ අවසන් අංකයේදී සිය දිවි හානි කර ගත්තා. ෆියුසය සියොලඟ දවාගෙන හරියටම විනාඩි පහකින් සැබෑ නාට්‍යය ඉවුරු කඩාගෙන ජීවිතයට ඇතුළු වුනා. අපිට අපි ගැනම ලැජ්ජා හිතුණු හන්දා ගිහිං බොරැල්ලේ බාර් එකකින් හොඳටෝම බිව්වා.

නාට්‍යයේ අවසන් අංකය-

තුවාල දා හතයි, සුවනීගේ මිනියයි වේදිකාවේ ඉදිරි දාරයේ හරි මැද තබා තිබුණා. සුවනීගෙ බෝනික්කා පැත්ත වැටිලා වේදිකාවේ දකුණු පැත්තේ නිදියන් උන්නා. සුවනීගේ ඔලුව දාරයෙන් මෙපිට - ප්‍රේක්ෂකාගාරය දෙසට කඩන් වැටිලා තිබුණා. තනි ස්පොට් ලයිට් එකක් රතට රතේ මිනිය නාවමින් උන්නා.

මිනිය දෙබස් කියමින් හිටියෙ- හදිසියේම ලයිට් බෝඩ් එකේ විදුලිය විසන්ධි වුනා. ප්‍රේක්ෂකයො හිතුවේ නාට්‍යය ඉවරයි කියලා. එයාලා බලන් උන්නා නළු-නිළියෝ ආචාර කරන්න එනතුරු. විනාඩි පහක් විතර ගියා. ලයිට් ආවේ නෑ. ලයිට් ආවේම නෑ.

සුවනී දිගටම එහෙමම හිටියා. මළමිනියක් වෙලා.

ලයිට් ආවේ නෑ.

සුවනී ලේ ගලන තුවාල දා හතක් එක්ක වේදිකාවේ උන්නා.

ලයිට් ආවේ නෑ.

ප්‍රේක්ෂකයෝ අවසානයක් නොමැති නාට්‍යයක් ඇතුළේ කළුවරේ සුවනීව තනියෙං දාලා නැගිටලා ගියා.

යන්නම ගියා.

සමහරු කාර් වල නැගලා පලා ගියා.

සමහරු බස් වලිං - සමහරු පයිං.

යන්නම ගියා.

සුවනී.

බෝනික්කෝ.

උං ගිහිං.

---


## තරංග ජයසේන

**koombiyaonline@yahoo.com**

2007-08-14


සෝවියට් ලේඛක යූරි ඔලේෂාගේ "තපුරු පාලකයෝ තුන් දෙනා" පොතේ අවසන් පිටුවේ සිට සර්කස් කරනමක් ගසා මගේ ඔළුවට පැන්න ආදරණීය දරු දෙන්නා - "සුවනී" සහ "ටුට්ටි" මේ වියමන ලියවෙන තුරුම මට හුගක් වද දුන්නා.